අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
**OFFICE ON MISSING PERSONS**

---

**මාධ්‍ය නිවේදනය** **2020 පෙබරවාරි මස 10**

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු වාර්තා නිකුත් කිරීම ආරම්භ කරයි.**

දක්නට නොමැති බවට වූ සහතික [Certificate of Absence (CoA)] ලබා ගැනීම උදෙසා අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන්ගේ පවුල්වලට අතුරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ආරම්භ කර තිබේ.

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ 13(1)(අ)(i) වගන්තිය ප්‍රකාරව අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරවන ලද තැනැත්තන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය පැවරී ඇත. 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනතේ 8උ වගන්තියේ දක්වා ඇති විශේෂ කාර්ය පටිපාටියට අනුව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන දක්නට නොමැති බවට වූ සහතිකයක් ලබා ගැනීමට මෙම අතුරු වාර්තාව භාවිතා කළ හැකිය. මෙම විශේෂ කාර්ය පටිපාටිය දක්නට නොමැති බවට වූ සහතිකයක් ලබා ගැනීම සඳහා වන සම්මත කාර්ය පටිපාටියට ඇති සරල විකල්පයකි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතට අනුව 1) උතුරු නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම්වලදී අතුරුදහන් වූ හෝ ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ සන්නද්ධ හමුදාවල හෝ පොලීසියේ සාමාජිකයින් හෝ 2) දේශපාලන නොසන්සුන්තාවයක් හෝ සිවිල් කැරළි කෝලාහල අතරතුරදී අතුරුදහන් වූ හෝ 3) බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් හේතුවෙන් හෝ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට දක්නට නොමැති බවට වූ සහතික ලබා ගැනීම උදෙසා අතුරු වාර්තා නිකුත් කළ හැකිය.

දක්නට නොමැති බවට වූ සහතිකය මගින් අතුරුදහන් වූ තැනැත්තාගේ තත්ත්වය තහවුරු කෙරෙන අතර, යම් සමාජ සුභසාධන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීමේදී, අතුරුදහන් වූ තැනැත්තාගේ දේපළ සහ වත්කම් තාවකාලිකව කළමනාකරණය කිරීමේදී, දිසා අධිකරණයේ අධීක්ෂණය යටතේ අතුරුදහන් වූ තැනැත්තාගේ දරුවන්ට තාවකාලික භාරකරුවකු සේ කටයුතු කිරීමේදී හෝ විධායක, පරිපාලන සහ අධිකරණ අධිකාරීන් ඉදිරියේ අතුරුදහන් වූ තැනැත්තා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමේදී මෙම සහතිකය ප්‍රයෝජනවත් වනු ඇත. දක්නට නොමැති බවට වූ සහතිකය, මරණ සහතිකයට වෙනස් වූ නීතිමය ලේඛනයකි.

අතුරු වාර්තාවක් ලබා ගැනීමට කැමති අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් හට නියමිත පරිදි සම්පූර්ණ කළ අයදුම්පතක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඉදිරිපත් කළ හැකිය. මෙම අයදුම්පත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් ලබා ගත හැකි අතර, සුදුසු ආධාරක ලේඛන අයදුම්පතට ඇමිණිය යුතු වේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඉදිරිපත් කරනු ලබන ලේඛන සහ වාචික සාක්ෂි සලකා බලා පරීක්ෂණයකින් අනතුරුව අතුරු වාර්තාව නිකුත් කරනු ලැබේ.